

# නිවසේ අනතුරු

ටී. සබාරත්නම්
කතෘ
ඩේලි නිවුස්

තම තුන් හැවිරිදි පුත් මංජුල පුෂ්ප කුමාරගේ මරණය පිළිබඳ දුක්මුසු කතාව විස්තර කල ශ්‍රියාවතී සිහිසුන්ව ඇද වැටුණාය. "අපි ජීවත් වන්නේ වැල්ලම්පිටියේ මගේ සහෝදරියගේ පවුලත් සමගයි." ඇය අතිරේක නාගරික මරණ පරීක්ෂක එඩ්වඩ් අහංගම මහතා ඉදිරියේදී පැවසුවාය. මුදවාපු කිරි විකුණන මගේ මස්සිනා පසුගිය 1994 පෙබරවාරි 28 වන දින අඩි 2 ක් ගැඹුරැති කල්දේරමක කිරි උතුරවා කාමරයක තිවෙන්නට තබා තිබුණා. ටික වෙලාවකට පසු මගේ දරු දෙදෙනාගෙන් වැඩිමහල් පුතා කෑගසන හඬක් ඇසුණා. මා ඇතුලට ගිය විට පුතා කල්දේරමට වැටී සිටිනු දුටුවා. මා ඔහුව එයින් එළියට ඇද ගත්තා. ඔහුගේ හම ගැලවී යන්ට පටන් ගත්තා. ඔහුව සෝද මම රිජ්වේ ළමා රෝහලට ගෙන ගියා. සතියකට පසු ඔහු මිය ගියා."

වසර දෙකක් වයස ඇති ජයන්තිගේ දෙමව්පියන් 1984 පෙබරවාරි මස 4 වන දින තවත් ආකාරයක පුවතක් සැල කරමින් ඇයව පුත්තලම රෝහල වෙත ගෙන ගියහ. ළමයා තම පියාගේ බෝල්පොයින්ට් පෑන උදුරාගෙන තම මව වෙත දිව යමින් සිටියාය. අතරමගදී ඇය බිම ඇද වැටීමෙන් බෝල්පොයින්ට් පෑන ඇස තුලට කාගෙන ගියේය.

1994 පෙබරවාරි 5 වන දින, මාතර මූලික රෝහලේදී මාස නවයක් වයසැති බිළිඳෙකු පිළිස්සුම් තුවාල වලින් මිය ගියේය. විජය කුමාරවේදන් නිද සිටි තොට්ල්ල මත කුප්පි ලාම්පුවක් පෙරළීමෙන් එය ගිණි ඇවිළිනි. මීට සති කිහිපයකට පෙර ඉරණවිල ප්‍රදේශයේ ලක්මාලි නම් එක් අවුරුදු ළදැරියක් බංකුවක් මත තිබූ කුප්පි ලාම්පුවක් පෙරළා ගැනීමෙන් ඇයගේ ඇඳුම් වලට ගිනි ඇවිළිනි.

පසුගිය වසරේ ඔක්තෝබර් 25 වන දින පවුලක වැඩිමල් දරුවා පැට්‍රෝල් මැක්ස් ලාම්පුවකට සුළං ගසමින් සිටියදී ලාම්පුව පිපිරීමෙන් එම පවුලේ දරුවන් 4 දෙනෙක් තුවාල ලැබූහ. අනෙකුත් ළමයින් වටේට සිට ලාම්පුවට සුළං ගසන දෙස බලා සිට ඇත. මෙය සිදුවූයේ පොළොන්නරුවේ සීලපුර නම් ගමේදීය.

මේ මා මෑතදී පලවූ පුවත්පත් බැලීමෙන් තෝරා ගත්, ළමා මරණ හා තුවාලවීම් පිළිබඳ ප්‍රවෘත්ති කිහිපයකි. ශ්‍රී ලංකාවේ නිවෙස් වල අනතුරු වලින් සිදුවන මරණ පිළිබඳව කිසිදු වැදගත් අධ්‍යයනයක් මෙතෙක් සිදු කර නැත. ඇමරිකාවේ අළුතින් කරන ලද අධ්‍යයනයකින්, එක්සත් ජනපදයේ ළමා මරණ වලට ප්‍රධාන හේතුව වශයෙන් පෙන්නුම් කර ඇත්තේ නිවසේ සිදුවන අනතුරුය. සෑම වසරකම, වයස අවුරුදු 14 ට අඩු ළමයින් 8000 කට වැඩි සංඛ්‍යාවක් නිවසේදී සිදුවන අනතුරු වලින් මියයන අතර, ළමුන් 50,000 ක් පමණ අංගච්ඡේදනයෙන් (අතපය කැඩීයාමෙන්) මිය යන බව එයින් හෙළිවේ. විෂ ශරීරගතවීම්, වැටීම්, දියේ ගිලීම්, පිළිස්සීම්, ගෙල මිරිකීම් සහ වාහන අනතුරු මේවාට තුඩුදෙන ප්‍රධාන හේතු වෙයි.ශ්‍රී ලංකාවේ පුවත්පත් වාර්තා විශ්ලේෂණයේදී, මෙහිදී ද ඒ හා සමාන තත්වයක් පවතින බවක් පෙනී යයි. මෙම උවදුරට වඩාත්ම ගොදුරු වන්නේ මාස 9 සහ වසර 5 අතර වයසේ දරුවන් බවද පෙනී යයි. විෂ ශරීරගත වීම වැඩි වශයෙන්ම සිදු වන්නේ වැරදීමෙනි. ප්‍රධාන වශයෙන්ම දෙමව්පියන්, භාරකරුවන්ගේ

**දරුවන් තුල දැඩි කුතුහලයක් ඇත.**

**ඔවුන් යම් යම් දේ ඉගෙන ගන්නේ එමගිනි.**

**දෙමව්පියන් විසින් ආරක්ෂා සහිතව කටයුතු කල යුතුය.**



VIDU516-122-16

නොසැලකිලිමත් භාවය නිසා මෙය සිදු වෙයි. දරුවන් සෑම දෙයකම රස බැලීමට කැමති බැවි දෙමාපියන් අවබෝධ කරගත යුතුය. එක් මවක් වැසිකිළිය පිරිසිදු කරමින් සිටියදී දෙරවුවෙහි සීනුව නාද විය. ඇය දෙර කරා ගොස් ආපසු එනවිට තම 18 මස් වියැති දියණිය ප්‍රියන්කා, තමා බිම තබාගිය කොස්ටික් සෝඩා වලින් මදක් ගෙන රස බලා ඇති බව දක්නට ලැබිණි. ඉන් ඇගේ දිව සහ උගුරේ කොටස් පිලිස්සී තිබිණ. මෙයින් දැරිය සති 6 ක් මුළුල්ලේ රෝහල් ගත කර තැබීමට සිදුවිය.


පවිත්‍ර කිරීම, සේදීම සහ නිවෙස්වල කෘමීන් මර්ධනය සඳහාත්, විලවුන් වශයෙනුත් යොද ගන්නා රසායනික ද්‍රව්‍ය වලින් වැඩි කොටස, දරුවන්ට හානිකර වන බැවි දෙමාපියන් විසින් අවබෝධ කරගත යුතුය. සෝදන ද්‍රව්‍ය, විඛාදක ද්‍රව්‍ය, දැව භාණ්ඩ ඔප දමන පොලිෂ් වර්ග, විෂබීජ නාශක සබන් වර්ග, රැවුල බෑමෙන් පසු ගල්වන ආලේප, සුවඳ විලවුන්, රූපාලංකරණ ද්‍රව්‍ය, කපුරු බෝල, බෙහෙත් වර්ග, කුඩා බැටරි, මද්‍යසාර, සිගරට්, ගිනිකූරු, පැට්‍රෝල්, සායම් වර්ග, වල්පැලෑටි නාශක, මී නාශක, භූමිතෙල්, පොහොර වර්ග සහ අප නිවෙස්වල භාවිතා කරන වෙනත් බොහෝ දෑ විෂ සහිත වෙයි.

සෑම දෙමව්පියකු විසින්ම, නොවරදවාම පිළිපැදිය යුතු කරුණු නම් මෙකී ද්‍රව්‍යය දරුවන්ට ළඟාවිය නොහැකි තැන්වල තැබීම සහ ඒවා යතුරු ලා ඇති ස්ථානයක තැබීමයි. කිසිම අවස්ථාවක පාවිච්චියට ගත් එබඳු ද්‍රව්‍ය බිම නොදමන්න. ආහාර පිසිමින් සිටි එක් මවක් සියඹලා ඇට කසළ බාල්දියට දැමුවාය. දරුවා ඒවා ඇහිඳ සියඹලා ඇටයක් නාස්පුඩුවේ දමා ගති. එය පිටතට නොඑන බැවින් දෙමව්පියෝ දරුවා වහා කළුබෝවිල රෝහලට ගෙනයන ලෙස උපදෙස් දුන්හ. අවුරුදු 3 ක් වයසැති තවත් දරුවෙක් තම මිත්තණිය පාවිච්චි කරන, පැණිරස ආලේපයක් සහිත බෙහෙත් පෙති දුටුවාය. දරුවා එම බෙහෙත් පෙති වලින් 8 ක් අනුභව කිරීම නිසා ක්ෂණිකව රෝහලට ගෙන යාමට සිදු විය.

වැටීම්, දරුවන්ට සිදුවන අනතුරු අතරින් ප්‍රධාන තැනක් ගනියි. නගරබද දරුවෝ ඔප දැමූ පොළොව මතුපිට හැළුණු ජලය මත ලිස්සා වැටීමෙන් ඔවුන්ගේ අත් කැඩෙයි. ගම්බද පෙදෙස්වල ළමයින් ගස්වලින් වැටීමෙන් ඔවුන්ගේ කකුල් කැඩෙයි. සිලා ජේර ගසකින් වැටී කලුගලක් මත පතිතවීමෙන් ඇයගේ කොන්ද සහ හිස්කබලද බිඳිණි. පොල් ගෙඩි හිස මත වැටීම නිසා ළමයින් මිය යන අවස්ථාද ඇත. හයමස් වයසැති සාවිත්‍රි ප්‍රියංගනීට මෙවැන්නක් සිදුවිය. ඇයගේ දෙමව්පියෝ රැකියාවල යෙදෙති. ඇයගේ මිත්තණිය දැරිය නිවසට ගෙන යද්දී, පොල් ගෙඩියක් දැරියගේ හිස මත වැටී දැරිය මිය ගියාය. මෙය සිදු වූයේ දංකොටුවේදීය. බියගම, තුන්හැවිරිදි ජානකී මිදුලේ සෙල්ලම් කරමින් සිටියදී ඇයගේ හිසමතට පොල් ගෙඩියක් වැටීමෙන් ඇය එතැනම මිය ගියාය.

දියේ ගිලීමද ශ්‍රී ලංකාවේ සුලභව සිදුවන්නකි. මේනකාගේ දරුවන් දෙදෙනෙක් ඉකුත් වසරේ නොවැම්බර් 30 වන දින වැල්ලම්පිටියේ තම ගෙමිදුලෙහි සෙල්ලම් කරමින් සිටියහ. සවස වැඩිමල් දරුවා පෙරලා පැමිණි මුත් අනෙක් දරුවා නොපැමිණියේය. "මම ළමයා සොයන්ට ගියා" මේනකා ඉකි ගැසුවාය. "ළමයා බැම්මක් නැති ළඳක වැටී දියෙහි ගිලී සිටියා." ගංගා පොකුණු සහ වැව් වල ගිලීමද සුලභව සිදු වෙයි.

දරුවන් තුළ දැඩි කුතුහලයක් ඇත. ඔවුන් යම් යම් දේ ඉගෙන ගන්නේ එමගිනි. දෙමව්පියන් විසින් ආරක්ෂා සහිතව කටයුතු කළ යුතුය. ඩේවිඩ්ගේ මව මදක් ප්‍රවේසම් වූවා නම් 14 මසක් වයසැති ඔහු විදුලි සැරෙන් මිය නොයනු ඇත. කුඩා දරුවා විදුලි පේනුව (electric plug) සමග සෙල්ලම් කිරීමට පුරුදුව සිටියේය. එදින උදෑසන ඩේවිඩ් තම කුඩා ඇඟිල්ල සිදුර තුළට ඔබන විට ස්විචය ක්‍රියාත්මකව තිබිණි.



**දරුවන් තුළ දැඩි කුතුහලයක් ඇත**